**පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 24 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

සුළු ණය හිමියන් යටතේ ප්‍රතිපාදනය කර තිබූ මුළු එකතුව රු. 9,620,059 ක් වටිනා ප්‍රාග්ධන වැඩ 14 ක් ආරම්භ නොකර සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබීමෙන් සභාවේ ස්ථාවර වත්කම් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

සුළු ණය හිමි යටතේ ප්‍රතිපාදනය කර තිබූ මුළු එකතුව රු. 171,400 ක් වටිනා ගනුදෙනු 03 ක් පසුගිය වර්ෂ 01 සිට 06 දක්වා නිරවුල් කර නොතිබුණි.

#### 1.3.4 විගණන සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම

කුවිතාන්සි සහ ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 468,700 ක්වූ මෝටර් ග්‍රේඩර සහ ගල්රෝල බදු කුලී ආදායම විගණනයේදී සතුටුදායකව සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 අනුකූල නොවීම**

**-------------------**

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ පරිච්ඡේදය III වගන්තිය 24 | - | ප්‍රාදේශීය සභාව ස්ථාපිත කර වසර 03ක් ඇතුලත සභාව සතු මහා මාර්ග සහ මංමාවත් වල විස්තර රජයේ ගැසට් පත්‍රයේ පළ කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) පරිච්ඡේදය III රීති 66 | 5,412,332 | හිඟ ආදායම් ගිණුම් පෙන්වා තිබු හිඟ ආදායම් ශේෂ අදාල කාල පරිච්ඡේදයේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය V රීති 140 | 4,539,848 | අත්තිකාරම් 11 ක් පසුගිය වර්ෂ 01 සිට 02 දක්වා කාලයතුල පියවා නොතිබුණි. |
| (iii) පරිච්ඡේදය IX රීති 180 | | සභාවේ මුදල් හා ගබඩා භාරව කටයුතු කරන නිලධාරින්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තිය | 154,000 | සේවය හැරගිය නිලධාරින් 02 දෙනෙකුගෙන් අයවියයුතු ආපදා ණය සහ උත්සව අත්තිකාරම් හිඟ මුදල පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා අයකිරීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| මුදල් රෙගුලාසි 571 | 4,366,633 | කල් ඉකුත්වූ තැන්පත් 47 ක් සම්බන්ධයෙන් පසුගිය වර්ෂ 01 සිට 02 දක්වා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 16,471,037 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 9,312,671 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2017** | | | | **2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | - | - | - | - | - | - | | - |
| (ii) | කුලී | 4,101,356 | - | 4,193,279 | 184,970 | 6,256,696 | - | 4,128,681 | 170,956 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 338,750 | - | 407,636 | 3,200 | 300,500 | - | 368,910 | 500 |
| (iv) | වෙනත් ආදායම් | 8,982,100 | - | 18,036,372 | 5,224,161 | 5,566,500 | - | 11,943,913 | 4,679,428 |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට පවරා ගෙන නොතිබුණු වාහන 15 ක් පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 09 කට වඩා වැඩි කාලයක් සිට සභාව විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපාදනය කරන ලද රු. 1,060,000 ක් වටිනා වැඩ 5 ක් අත්හැර දමා තිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**(i) සේවක මණ්ඩල පුරප්පාඩු සහ අතිරික්ත**

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්‍ය මණ්ඩලය 64 ක්වූවද, තථ්‍ය කාර්ය මණ්ඩලය 53 කි. සේවක මණ්ඩල පුරප්පාඩු 11 පිරවීමට කටයුතු නොකිරීමෙන් ඒ අයගෙන් ලබාගත හැකි වැඩ කටයුතුවලට බාධා සිදුවී තිබුණි.

**(ii) සේවක ණය**

සේවය හැර ගිය නිලධාරින් 02 දෙනෙකුගෙන් අයවියයුතු හිඟ සේවක ණය මුළු එකතුව රු. 154,000 ක අදාල වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතාවය**

ඉකුත් වර්යේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණු රු. 10,053,439 ක් වටිනා ප්‍රාග්ධන වැඩ 12 ක් ඉටුකිරීමට සමාලොචිත වර්ෂය අවසානය දක්වා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලංකා බැංකුවේ ජංගම ගිණුමක රු. 17,853 ක මුදලක් වර්ෂ 8 ක සිට නිෂ්කාර්යව තිබුණි.

(ආ) මාර්ග අළුත්වැඩියා වැඩ සඳහා සභාව විසින් මිලදී ගෙන තිබු රු. 11,722 ක් වටිනා තාර බැරල් 04 ක් වර්ෂ 04 කට වඩා වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවාගෙන තිබුණි.

**4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

අයවැය ගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු. 68,886 සිට රු. 8,252,096 ක් දක්වා නොහොත් සීයට 16.9 සිට සීයට 59.7 දක්වා විචලනයක්ද ඇස්තමේන්තු ගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 10,050 සිට රු. 5,775,921 ක් දක්වා නොහොත් සීයට 12.3 සිට සීයට 23.8 දක්වා විචලනයක් නිරීක්ෂණය විය.

**5 පද්ධති හා පාලන**

විගණනයේ නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | **පද්ධතිය** | **අඩුපාඩු** |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | වරිපනම් බදු තක්සේරු සම්බන්ධයෙන් තක්සේරු ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ආ) | හිඟ ආදායම් අයකිරීම | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | පුරප්පාඩු කාර්‍ය මණ්ඩලය පිරවීම සඳහා කටයුතු නොකිරීම. |